www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# පියසීලි විජේගුනසිංහ -- ශ්‍රී ලංකාවේ ට්‍රොට්ස්කිවාදියා 67 වන වියෙහි දී මිය යයි

## Piyaseeli Wijegunasinghe—a Sri Lankan Trotskyist dies at 67

සමාජවාදී සමානතා පක්ෂය විසිනි

2010 සැප්තැම්බර් 6



හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ශ්‍රී ලංකා ශාඛාව වන සමාජවාදී සමානතා පක්ෂයේ (සසප) සාමාජිකා, පියසීලි විජේගුනසිංහ සහෝදරියගේ අකල් මරනය අප වාර්තා කර සිටින්නේ දැවැන්ත පාඩුවක් පිලිබඳ හැඟීමකිනි. පියසීලි සිය ජීවිත කාලය පුරා ට්‍රොට්ස්කිවාදියකු මෙන්ම මාක්ස්වාදී විද්වතියක හා ජාත්‍යන්තර කම්කරු පන්තියේ අවශ්‍යතා වෙනුවෙන් කැප වූ සටන්කාරියක් විය.

පියයුරු පිලිකාවක් ඉවත් කිරීමට සිදු කල ශල්‍ය කර්මයකින් පසුව ඇගේ ඉතා වැදගත් ග්‍රන්ථීන් කිහිපයක ක්‍රියාකාරිත්වය ඇනහිටීම හේතුකොටගෙන බ්‍රහස්පතින්දා අලුයම පියසීලි මිය ගියාය. ඇය ඊට පෙර පිලිකා සඳහා ප්‍රතිකාරවලට ලක් කෙරුනු අතර පසුගිය කාලයේ තවත් රෝග ගනනාවකින් ද පෙලුනි. මිය යන විට ඇය යන්තම් 67 වන වියට එලඹුනා පමනි.

පියසීලි සසප ප්‍රධාන ලේකම් විජේ ඩයස්ගේ බිරිඳ හා සහකාරිය විය. ඇය 42 හැවිරිදි සිය පුත්‍රයා වන කීර්ති රනබා විජේගුනසිංහගෙන්, ඇගේ ලේලිය වන අංජනාගෙන් හා සත් මස් වියැති මිනිබිරිය වන ජනාර්තිගෙන් ද වියෝ විය.

පියසීලි දන්නා සෑම අයෙක් ම -- පක්ෂ සාමාජිකයන්, කොලඹ විශ්වවිද්‍යාලයේ ඇගේ වෘත්තීය සගයන් හා ශිෂ්‍යයන්, මිතුරන් හා පවුලේ සාමාජිකයන් -- උනුසුම්, සංස්කෘතිකමය හා කීර්තිමත් පුද්ගලයකු ලෙස ඇය හඳුනාගෙන තිබුනි. ඇය සාහිත්‍යය අධ්‍යයනය විෂයයෙන් සමස්ත ශිෂ්‍ය පරම්පරාවකට ම අධ්‍යාපනය ලබා දුනි. එය ඇගේ බුද්ධිමය ලාලාසාව විය. ඇගේ දේශපාලනික හා ශාස්ත්‍රාලික සතුරන් පවා ඇය හා ඇගේ බලගතු බුද්ධිය කෙරෙහි දැක්වූයේ ගෞරවයකි.

පක්ෂ සහෝදරවරු අතර පියසීලි හඳුනාගෙන තිබුනේ නොමසුරුව ආගන්තුක සත්කාරයෙහි යෙදෙන්නියක ලෙසය. ඇගේ නිවස ඔවුන් සඳහා නිරතුරුවම විවෘතව පැවතුනි. සාමාන්‍යයෙන් අඩුවෙන් කතා කරන ඇය විවිධ අවස්ථාවන්හි දී නාට්‍යවල රඟපෑමට සහ ඇගේ මනා කටහඬින් ගී ගැයීමට දිරිගැන්විය හැකිය. විශේෂයෙන් ම බටහිර සංගීත රචකයන් අතරින් බීතෝවන් ඇතුලු, පුලුල් පරාසයක සංගීත නිර්මාන කෙරෙහි ඇය දැක්වූ සහෘදත්වය සාහිත්‍යය පිලිබඳව ඇයට පැවති ඇල්ම සමග මනා ලෙස ගැලපුනි.

පියසීලි 1943 පෙබරවාරි 20 දා දකුනු ශ්‍රී ලංකාවේ ගාල්ල අසල හපුගල ගම්මානයේ උපත ලැබීය. ඇය පලමුව මහමෝදර ග්‍රාමීය විදුහලින් අධ්‍යාපනය ලැබූ අතර පසුව ගාල්ලේ සවුත්ලන්ඩ් බාලිකා විදුහලට ඇතුලත් විය. එම විදුහල ඇය කෙරෙහි අතිමහත් බලපෑමක් ඇති කල බව ඇය නිරතුරුවම මතක් කලාය. ඇයට එහි දී ඉංග්‍රීසි සාහිත්‍යය හැදෑරීමට අවස්ථාව ලැබුනු අතර පාසලේ විවාද කන්ඩායමට නායකත්වය දෙමින් සිය බුද්ධිමය හා කතික හැකියාව ප්‍රථම වතාවට පෙන්නුම් කලාය.

කෙසේවෙතත්, අතිමූලිකව ගත් කල, පියසීලිගේ ජීවිතය හැඩගැස්වූනේ ට්‍රොට්ස්කිවාදයෙනි. ඇය පේරාදෙනිය විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂිකාවක ලෙස දේශපාලනයට ඇදුනු අතර නේවාසික පහසුකම් ප්‍රමානවත් නොවීම අරබයා 1965 දී හටගත් ශිෂ්‍ය විරෝධතාවල

නායිකාවක ලෙස ඇය ඉස්මතු විය. පොලීසිය බැටන් හා කඳුලු ගෑස් ප්‍රහාරයකින් ශිෂ්‍ය විරෝධතාව මර්දනය කලේය. ඒ වන විට ඇගේ පෙම්වතා බවට පත්ව සිටි ශිෂ්‍ය සංගම් සභාපති විජේ ඩයස් ඇතුලු තවත් සිසුන් ගනනාවක් සමග ඇය මාස තුනක කාලයකට විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය භාවය අත්හිටුවීමකට ලක් කෙරුනි.



1964 දී ලංකා සමසමාජ පක්ෂය (ලසසප) සිරිමා බන්ඩාරනායක මැතිනියගේ ධනේශ්වර ආන්ඩුවට ඇතුලු වෙමින් ට්‍රොට්ස්කිවාදය ඓතිහාසිකව පාවාදීම අවබෝධ කරගැනීමේ උත්සාහයක යෙදෙමින් සිටි රැඩිකලීකරනය වූ තරුන කන්ඩායමකට විජේ ඩයස් අයත් විය. සමාජවාදී ජාත්‍යන්තරවාදයේ මූලධර්ම මෙලෙස අතිමූලිකව අතහැර දැමීම වනාහි, වසර ගනනාවක් තිස්සේ ලසසපයේ දේශපාලනික පල්ලම් බැසීම අනුමත කර තිබූ මයිකල් පැබ්ලෝගේ සහ අර්නස්ට් මැන්ඩල්ගේ නායකත්වයෙන් යුක්ත ජාත්‍යන්තර අවස්ථාවාදී ප්‍රවනතාවක නිෂ්පාදිතයක් විය.

පැබ්ලෝවාදී අවස්ථාවාදයට විරුද්ධව සටන් වැදීම පිනිස 1953 දී හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව පිහිටුවන ලදි. මෙම පාඩම් මත පාදක වෙමින්. 1968 දී කීර්ති බාලසූරියගේ නායකත්වය යටතේ හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ශ්‍රී ලංකා ශාඛාව ලෙස විප්ලවවාදී කොමියුනිස්ට් සංගමය (විකොස) පිහිටුවන ලදි. විජේ විකොස ආරම්භක සාමාජිකයෙක් වූ අතර පියසීලි වැඩි කලක් යාමට පෙර එයට බැඳුනි.

විජේ සහ පියසීලි 1967 දී විවාහ විය. එම වසරේ දී ම ඇය කොලඹ විශ්වවිද්‍යාලයේ සහකාර කථිකාචාර්යවරියක් විය. ඔවුන්ගේ පුත්‍රයා වන කීර්ති ඉපදුනු ඊලඟ වසරේ දී විජේ ද එම විශ්වවිද්‍යාලයේ සහාය කථිකාචාර්ය තනතුරක් ලැබීය. 1969 දී ඇය සහ විජේ පශ්චාත්-උපාධි අධ්‍යයනය සඳහා එංගලන්තය බලා පිටත් විය. පියසීලි ලීඩ්ස් විශ්වවිද්‍යාලයෙන් ඉංග්‍රීසි සාහිත්‍යය පිලිබඳ ගෞරව උපාධියක් ලැබීය.

පියසීලි, හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ බ්‍රිතාන්‍ය ශාඛාව වූ සෝෂලිස්ට් ලේබර් ලීගයේ (එස්එල්එල්) ද සාමාජිකාවක් විය. 1961-63 දී සමාජවාදී කම්කරු පක්ෂය (සකප) පැබ්ලෝවාදී කඳවුර සමග අප්‍රතිපත්තික ලෙස යලි එකමුතු වීමට එරෙහි අරගලය තුල එස්එල්එල් නායක කාර්යභාරයක් ඉටු කර තිබුනි. එස්එල්එල් උද්ඝෝෂනවලට හා අධ්‍යාපන කඳවුරුවලට ඇයට සහභාගි වීමට ලැබීම ඇගේ ජාත්‍යන්තර දෘෂ්ටිය ශක්තිමත් කල බව ඇය පසු කලෙක මතක් කලාය.

දෙවන බන්ඩාරනායක සභාග ආන්ඩුව පිහිටුවීමෙන් පසුව හටගත් දේශපාලන කලබගෑනිවලට ක්ෂනිකව ඉක්බිතිව 1972 දී විජේ සහ පියසීලි ශ්‍රී ලංකාවට පෙරලා පැමිනියාය. එම ආන්ඩුව ජනතා විමුක්ති පෙරමුනේ (ජවිපෙ) නායකත්වයෙන් හටගත් ග්‍රාමීය සිංහල තරුනයන්ගේ සන්නද්ධ නැගිටීම තලාදැමීම පිනිස 1971 දී හමුදාව යොදවා තිබුනි. එහි දී ආරක්ෂක හමුදා තරුනයන් 15,000ක් පමන ඝාතනය කල බවට තක්සේරු කෙරෙයි.

ජවිපෙ සිංහල ජාතිකවාදී හා ගරිල්ලා දේශපාලනය පිලිබඳව එයට පවත්නා අතිමූලික මතභේද තිබිය දී ම, විකොස රාජ්‍ය මර්දනයට එරෙහිව ජවිපෙ ආරක්ෂා කලේය. එහි ප්‍රතිඵලයක් ලෙස, විකොස පුවත්පත් තහනම් කෙරුනු අතර පක්ෂ සාමාජිකයන් දෙදෙනෙක් පොලිස් අත්අඩංගුවේ දී ඝාතනය කෙරුනි. එය කෙසේවෙතත්,

විකොස ආන්ඩුවේ පුලුල් වන දඩයම් ව්‍යාපාරයට එරෙහි සිය උද්ඝෝෂනය අඛන්ඩව ඉදිරියට ගෙන ගියේය.

1973 දී, සභාග ආන්ඩුව විවේචනය කල සහ සිය කෘති තහනමට ලක් වූ ප්‍රසිද්ධ කලාකරුවන් ආරක්ෂා කිරීම සඳහා පක්ෂය ගෙන ගිය උද්ඝෝෂනය තුල පියසීලි නායක කාර්යභාරයක් ඉටු කලාය. ධම්ම ජාගොඩගේ *මලවුන්ගේ නැගිටීම*, සයිමන් නවගත්තේගමගේ *පුස්ලෝඩං* සහ සමන් සුසිරිගේ *වෙස්සන්තර* එලෙස තහනමට ලක් වූ නිර්මානවලට ඇතුලු විය. පක්ෂයේ සප්‍රතිපත්තික ආස්ථානය, කලාකරුවන් ද ඇතුලුව, මහජනතාව තුල සැලකිය යුතු ගෞරවයක් දිනාගැනීමට සමත් විය.

පියසීලි, විකොස ප්‍රධාන ලේකම් බාලසූරියගේ ද උනන්දුවට ලක් වූ ක්ෂේත්‍රයක් වූ, කලා හා සාහිත්‍ය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් පක්ෂයේ පුවත්පත්වලට මානෙල් හපුගල යන ලේඛක නාමයෙන් ලිපි ලිවීය. කුප්‍රකට මොස්කව් අවනඩු පරීක්ෂාවට ලක් කිරීම මගින් ස්ටැලින්වාදයේ ක්‍රියාකලාපය එලිදරව් කල නාට්‍ය වැනි දේශපාලන තේමාවන් රැගත් විකොස නිර්මානය කල නාට්‍යවල ද ඇය රඟපාමින් ඒවාට දායක විය.

විශ්වවිද්‍යාල කථිකාචාර්යවරියක ලෙස කටයුතු කිරීමේ දී, පියසීලි, සාහිත්‍යය හා සාහිත්‍ය විචාරය සම්බන්ධයෙන්, මාක්ස්වාදී, එනම් භෞතිකවාදි, ප්‍රවිෂ්ටයක් විස්තාරනය කලාය. 1982 දී පල කෙරුනු, *සාහිත්‍යය -- භෞතිකවාදී අධ්‍යයනයක්* නම් වූ ඇගේ ප්‍රථම ග්‍රන්ථය, පෙර කාල පරිච්ඡේදය තුල ආධිපත්‍යය දැරූ විඥානවාදී දර්ශනයට හා ආගමික සංකල්පවලට අභියෝග කලේය. "අද්‍යතන ලාංකික ධනේශ්වර විචාරකයන්ගෙන් බොහෝ දෙනෙක් තම විචාර විධික්‍රම ගොඩනංවා ගන්නේ (ඉන්දියානු) රසාද්වාදයේ ගැබ්ව තිබෙන විඥානවාදි සංකල්ප මත පදනම් වෙමිනි. එබඳු අද්‍යතන සංකල්ප පිලිබඳව අපෝහක භෞතිකවාදි දෘෂ්ටියේ පිහිටා කෙරෙන විචරනයක් ද මේ කෘතියෙහි අන්තර්ගත වේ." යනුවෙන් ඇය එහි පෙරවදනේ ලිවීය.

ඇගේ ග්‍රන්ථයෙන් විවේචනයට ලක් කෙරුනු, සාහිත්‍ය විචාරය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ ප්‍රාමානිකයකු වූ, එදිරිවීර සරත්චන්ද්‍ර, ප්‍රතිචාර දැක්වූයේ පියසීලි දර්ශනවාදය ගැන කිසිවක් නොදන්නා බව ප්‍රකාශ කරමිනි. ඇය සරත්චන්ද්‍රගේ දර්ශනවිද්‍යාත්මක විධික්‍රමවල දරිද්‍රතාව තව දුරටත් එලිදරව් කරමින් ද ශ්‍රී ලංකාවේ තවත් ප්‍රමුඛ ලේඛකයන් දෙපලක් වන මාටින් වික්‍රමසිංහගේ හා ගුනදාස අමරසේකරගේ කෘතීන් පිලිබඳ විවේචනයක් වර්ධනය කරමින් ද *නූතන සිංහල සාහිත්‍ය විචාරය -- මාක්ස්වාදී අධ්‍යනයක්* යන මැයෙන් දෙවන ග්‍රන්ථයක් ලියමින් එයට පිලිතුරු දුනි.

1964 ලසසප පාවාදීමේ හා සිංහල අධිපතිවාදයට එය අනුගතවීමේ භයංකර දේශපාලන ප්‍රතිවිපාක වඩාත් විෂද වූයේ 1977 බන්ඩාරනායක ආන්ඩුවේ පරාජය හමුවේ ය. ජේ.ආර්. ජයවර්ධනගේ නායකත්වයෙන් යුක්ත දක්ෂිනාංශික එක්සත් ජාතික පක්ෂ (එජාප) ආන්ඩුව, දිවයින විදේශ ආයෝජනයන්ට විවෘත කරමින්, වෙලඳ පොල-හිතැති ප්‍රතිව්‍යුහගතකරනයට හැරී ගත්තේය. වැඩෙන විරුද්ධත්වයට ප්‍රතිචාර ලෙස, ජයවර්ධන, කම්කරු පන්තිය භේද කරනු පිනිස දෙමල විරෝධී ස්වෝත්තමවාදය අවුලුවාලූයේ, අවසානයේ 1983 දී, දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට එරෙහිව දිවයිනේ දිගු කාලීන හා කටුක සිවිල් යුද්ධය දියත් කරමිනි.

මෙම වසර ගනනාව විකොසට විශේෂයෙන් ම අභියෝගකාරී විය. බ්‍රිතාන්‍යයේ දී, 1973 දී පිහිටුවන ලද, එස්එල්එල්හි පසුප්‍රාප්තිකයා වූ කම්කරු විප්ලවවාදී පක්ෂය (කවිපෙ), 1960 ගනන් මුල එය මහත් සේ වෙහෙස නොතකා සටන් වැද තිබූ පැබ්ලෝවාදී දේශපාලනයට අනුගත වෙමින්, දේශපාලනික පල්ලම් බැසීමක් ඇරඹීය. ජාත්‍යන්තර ව්‍යාපාරය තුල එයට තිබූ දේශපාලන අධිකාරිය හේතුකොටගෙන, මෙය විකොස ඇතුලු, හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ සියලු ශාඛාවන් මත විනාශකාරී බලපෑමක් ඇති කලේය. එහෙත් 1982 පටන්, එක්සත් ජනපදයේ වර්කර්ස් ලීගය කවිප නායකත්වයේ අවස්ථාවාදයට එරෙහිව දේශපාලන අරගලයක් දියත් කල අතර, එම අරගලය 1985-86 භේදය තුල මුදුන් පත් විය. එම භේදය තුල දී පියසීලි, විකොස සහ හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව සමග දෘඩතර ලෙස එකට සිටගත් අතර ඉන් පසු කාල පරිච්ඡේදයේ දී ජාත්‍යන්තර ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරය තුල මාක්ස්වාදයේ පුනර්ජීවනයට ප්‍රතිපදානයන් ද කලේය.

ඛේදනීය ලෙස, 1987 දෙසැම්බරයේ දී, දරුනු හෘදයාබාධයකින් 39 වන වියේ දී කීර්ති බාලසූරිය හදිසියේ මිය ගියේය. මෙම අසීරු කොන්දේසි යටතේ, විජේ ඩයස් නව ප්‍රධාන ලේකම් ලෙස විකොස නායකත්වයේ වගකීම්වලට උර දුන්නේය. ස්වකීය වැඩකටයුතුවල නිරත වන ගමන්ම, පියසීලි එම අසීරු කාලවල දී ඔහුට නිරතුරු සහායක මූලාශ්‍රයක් විය.

යුද්ධය උත්සන්න වූ තතු යටතේ, 1987 දී ඉන්දු-ලංකා ගිවිසුම ලෙස ප්‍රකට, ඉන්දියානු ආන්ඩුවේ මැදිහත්වීමෙන් ගෙන ආ සාම ගිවිසුමක් පිලිගැනීමට ජයවර්ධනට බල කෙරුනි. ජවිපෙ, මෙම ගිවිසුම ජාතිය පාවාදීමක් ලෙස හෙලාදකිමින්, විෂම වර්ගෝත්තමවාදී උද්ඝෝෂනයකින් එයට ප්‍රතිචාර දැක්වීය. විකොස සාමාජිකයන් තිදෙනෙකු ඇතුලුව, සිය ස්වෝත්තමවාදී උද්ඝෝෂනයට සහාය දීම ප්‍රතික්ෂේප කල, දේශපාලන විරුද්ධවාදීන්. වෘත්තීය සාංගමිකයන් හා කම්කරුවන් සිය ගනනක් ජවිපෙ තුවක්කුකරුවන් විසින් ඝාතනය කරන ලදි. වැඩෙන ජවිපෙ හා රාජ්‍ය ත්‍රස්තය මධ්‍යයේ, විජේ ඩයස් ඇතුලු ප්‍රමුඛ විකොස සාමාජිකයන්ට සැඟවී රහසිගතව දේශපාලන වැඩකටයුතුවල යෙදීමට සිදු විය. පියසීලි ද ඔවුන්ට එක් වූවාය.

1990 ගනන්වල දී, මහාචාර්ය සුචරිත ගම්ලත්ට එරෙහිව විවාදයක් ගෙනයාමට පියසීලිට බල කෙරුනි. විකොස සාමාජිකයකු ලෙස සිටි ගම්ලත් සාහිත්‍යය විචාරය

ගැන ලියූ නමුදු, කව්පෙ නායක ජෙරී හීලි ඉදිරිපත් කල මාක්ස්වාදී දර්ශනය විකෘත කිරීම්වලට සහාය දීමක් පෙන්නුම් කරමින් ඔහු පක්ෂය හැර ගොස් තිබුනි. ඔහු ඇගේ පෙර ග්‍රන්ථවලට එරෙහිව ප්‍රහාරයක් දියත් කලේය. 1995 දී පල කෙරුනු සුචරිත ගම්ලත්ට *එරෙහිව මාක්ස්වාදී කලා විචාරයේ මූලධර්ම* නමින් තෙවන ග්‍රන්ථයකින් ඇය එයට ප්‍රතිචාර දැක්වූවාය.

*ගොඩ් ඔෆ් ස්මෝල් තින්ග්ස්: විචාරයක් හා පිලිතුරක්* නම් වූ සිය සිවු වන ග්‍රන්ථය තුල දී, පියසීලි යලිත් මාක්ස්වාදී මූලධර්ම ආරක්ෂා කලාය. ඉන්දියානු ලේඛිකා අරුන්දතී රෝයි විසින් රචිත *ගොඩ් ඔෆ් ස්මෝල් තින්ග්ස්* නවකතාව පිලිබඳ ඇය කල විචාරයට විරුද්ධ වූ සුචරිත ගම්ලත් එම විචාරය අවිවේචනාත්මක යයි චෝදනා කලේය. සිය දීර්ඝ පිලිතුර තුල දී, පියසීලි ගම්ලත්ගේ අවස්ථාවාදී දේශපාලනය සහ සාහිත්‍යය විචාරය පිලිබඳ ඔහුගේ නොගැඹුරු මතුපිට ප්‍රවිෂ්ටය අතර සම්බන්ධය පෙන්නුම් කලාය. ඔහු ඉන්දියානු සමාජය පිලිබඳ එම ග්‍රන්ථය දැක්වූ අභිනිවේෂය ප්‍රමානවත් ලෙස සැලකිල්ලට භාජනය කිරීමකින් තොරව රෝයිගේ දේශපාලන සීමාසහිතකම් උවමනාවට වඩා අවධාරනය කොට තිබුනි.

පියසීලිගේ වැඩකටයුතු සැලකිය යුතු ආනුභාවයක් දිනාගැනීමට සමත් විය. කොලඹ විශ්වවිද්‍යාලයේ මාක්ස්වාදී සාහිත්‍යය විචාරය පිලිබඳ පාඨමාලාවක් ආරම්භ කිරීමෙහි ලා ඇය තීරනාත්මක ක්‍රියාකලාපයක් ඉටු කලාය. 1997 දී ඇය මහාචාර්ය සහ සිංහල සාහිත්‍යය අංශයේ ප්‍රධානි යන පදවිවලට උසස් කරන ලද අතර 2009 දී විශ්‍රාම යන තෙක්ම ඇය එම තනතුරු දැරුවාය.

ඒ අතරතුරම, පියසීලි ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයේ මූලික කෘතීන් ගනනාවක් ම සිංහලට පරිවර්තන කලාය. ඒවාට ට්‍රොට්ස්කිගේ *මාක්ස්වාදයේ ආරක්ෂාව සඳහා* යන ග්‍රන්ථයේ කොටසක්, ඩේවිඩ් නෝර්ත්ගේ *අප රක්නා උරුමය* හා *ජෙරී හීලි සහ හතර වන ජාත්‍යන්තරයේ ඉතිහාසය තුල ඔහුට හිමි තැන* සහ ඩේවිඩ් වොල්ෂ්ගේ *බෝල්ෂේවික්වාදය සහ අසම්ප්‍රදායික පෙරටුගාමී කලාකරුවෝ හා සමාජවාදයේ සෞන්දර්ය විද්‍යාත්මක අංශය* යන කෘතීන් ඇතුලත් විය. ඉන්දියානු උපමහාද්වීපයේ චිත්‍රපටි පිලිබඳව විශේෂයෙන්ම අවධානය යොමු කරමින්, පියසීලි *ලෝක සමාජවාදී වෙබ් අඩවියට* ඇගේ විචාර ලියමින් ප්‍රතිපදානයන් කලාය.

යන්තම් මාසයකට පමන ඉහත දී, සතිපතා *රාවය* පුවත්පත විසින් ඇගේ වෘත්තීය දිවිය පිලිබඳව පියසීලිව සම්මුඛ සාකච්ඡාවකට ලක් කෙරුනි. ඇය, කීර්ති බාලසූරිය හා මහාචාර්ය සුචරිත ගම්ලත් විසින් ආදර්ශමත් කෙරුනු ශ්‍රී ලංකාවේ සාහිත්‍යය විචාරයේ "ස්වර්නමය යුගය" ආවර්ජනය කරන ලෙස ඇයගෙන් ඉල්ලා සිටින ලදි. "ඔවුන්ගේ දෘෂ්ටිවාදීමය අරගලය සාහිත්‍ය කලාවේ ප්‍රබෝධයකට විශාල දායකත්වයක් සැපයූවා. දැවැන්ත පිබිදීමක් ඇති කලා, මෙම ස්වර්නමය යුගය දෙස ආපසු හැරී බලන විට ඔබට මොකද හිතෙන්නේ?"

පියසීලි ආවේනික නිහතමානිත්වයකින් හා වෛෂයිකත්වයකින් යුක්තව එයට පිලිතුරු දුන්නාය. "මේ රටේ මාක්ස්වාදී කලා විචාරයේ ස්වර්නමය යුගයක් ගැන කතා කල හැකිය කියා හෝ කල යුතුය කියා මා නම් හිතන්නෙ නැහැ. මාක්ස්වාදි කලා විචාරය ජාත්‍යන්තර පරිමානව සිද්ධ කෙරෙන්නක්. ඒ අනුව බලන විට මාක්ස්වාදී කලා විචාරයේ ස්වර්නමය යුගයක් සේ ඔබ හඳුන්වන යුගයේ ඇති නොවූ විරූ ප්‍රගමනයක් පසුගිය කාලය තුල මාක්ස්වාදී කලා විචාර ක්ෂේත්‍රයේ ඇති වී තිබෙනවා. දැන් මාක්ස්වාදී කලා විචාරයට යානය වනුයේ *ලෝක සමාජවාදී වෙබ් අඩවියයි.*"

එය වනාහි ජාත්‍යන්තරවාදය කාවැදුනු පිලිතුරකි. එනම් කලාව ද එබැවින් කලා විචාරය ද, එහි වපසරිය හා වර්ධනය සම්බන්ධයෙන් ගත් කල, පටු ජාතික සීමාවක හිර නොවූ ජාත්‍යන්තර ප්‍රපංචයක් බව අවබෝධ කර ගත් පිලිතුරකි. එමෙන් ම එය අනාගතය පිලිබඳ ඇයට පවත්නා සුභවාදය පිලිබිඹු කරන පිලිතුරකි. එනම්, කලා විචාරය වනාහි, සමාජවාදී මූලධර්ම මත පාදක වූ මානුෂ්‍ය හා සාධාරන ලොවක් හැඩගැස්වීමෙහි ලා කම්කරු පන්තිය මෙහෙයවීමේ ජාත්‍යන්තර ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයේ අරගලයේ වැදගත් සංරචකයක් වන බවයි.

සසප පියසීලි විජේගුනසිංහගේ මතකයට සිය ආචාරය පුද කරයි.

© www.wsws.org